මංජුක පුෂ්පකුමාර
ර/ ඇහැ /ධර්මපාල ම.වි

Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of

# කාර්ය පත්‍රිකාව - 21 වන සතිය

- **නිපුණතාව 0.1 - නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි**
- **නිපුණතා මට්ටම - පූජා භාණ්ඩ නිවැරදිව හසුරවමින් නර්තන අංග ඉදිරිපත් කරයි.**

## I කොටස

**නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

(01) කොතල පදය නර්තනය කිරීමේ දී යොදා ගන්නා රංග භාණ්ඩ සඳහන් වඩාත් නිවැරදි පිළිතුර

(i) කෙණ්ඩිය හා පුවක් මල් කිණිත්ත
(ii) දුම්මල කබල හා පුවක් මල් කිණිත්ත
(iii) සෙම්බුව හා කොහොඹ අත්ත
(iv) මැටි කළය හා පුවක් මල් කිණිත්ත
(v) මැටි කළය හා කොහොඹ අත්ත

(02) කොහොඹායක් කංකාරියේ හත් පද නර්තනයේදී කොතල පදය නර්තනය කරනු ලබන්නේ

(i) පළමු අංගය ලෙසයි
(ii) දෙවන අංගය ලෙසයි
(iii) තුන්වන අංගය ලෙසයි
(iv) සිව්වන අංගය ලෙසයි
(v) හත් වන අංගය ලෙයසි

(03) ''තාත් ජිංත කුඳ ගජිං කුං තරිකිට කුඳ ගජිං'' යනු කොතල පදය ට අයත්

(i) කස්තිරම් කොටසකි
(ii) ආවැඩීමේ පද කොටසකි
(iii) ගමන් මාත්‍රයකි
(iv) පැන් වැඩීමේ පදයකි
(v) අලංකාර පද කොටසකි

(04) කොතල පදය නැටීමේදී කොතලයට යොදා ගනු ලබන දියර වර්ගය වන්නේ

(i) කිරි වතුර
(ii) වතුර
(iii) කහ වතුර
(iv) සඳුන් වතුර
(v) තැඹිලි වතුර

(05) උඩරට කොතල පදයට පමණක් ආවේණික වූ ලක්ෂණයකි

(i) කවි ගායනා කරමින් නර්තනය කිරීම

(ii) අඹු කෝල් පදය නර්තනය කිරීම

(iii) පැන් වැඩීමේ පදය නර්තනය කිරීම

(iv) නර්තනයේදී ගායනය යොදා නොගැනීම

(v) කොතලය රැගෙන නර්තනය කිරීම

**හිස්තැන් පුරවන්න**

(01) කොතල පදයේ දී ගමන් මාත්‍රයෙන් පසු ........................................ පද නර්තන කිරීම සාම්ප්‍රදායික ක්‍රම වේදයයි .

(02) හත්පදය නර්තනය කිරීමේදී නර්තන ශිල්පියා වාදනය සමඟ මෙන්ම ........................................ ................................ භාණ්ඩ සමඟ ද සබඳතා පවත්වා ගත යුතුය.

(03) කොතල පදය ක්‍රමිකව ලය වේගය වර්ධනය වන ලෙස ........................................ යන ත්‍රිවිධ ලයට පිළිවෙලින් නර්තනය කිරීම ශාස්ත්‍රීය ගති ලක්ෂණයයි.

(04) ''ජිං කුඳගත් ජිං තකට ''යන බෙර පදය කොතල පදයේ ........................................ සඳහා වාදනය කරනු ලබයි.

(05) කොතල පදය මාත්‍රා ........................................ තාලයට නර්තනය කරනු ලබන ශාස්ත්‍රීය නර්තන අංගයකි.

## II කොටස

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න**

(01) කංකාරියේ දී කොතල පදය නර්තනය කිරීමේ අරමුණ හා එම නර්තනයේ දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ විස්තර කරන්න.

(02) කොහොඹා කංකාරියේ පූජා භාණ්ඩ අතැතිව නර්තනය කරනු ලබන හත් පදය පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

(03) සබරගමු හා පහරට නර්තන සම්ප්‍රදායන් වල රඟ දක්වන කොතල පදයට වඩා උඩරට නර්තන සම්ප්‍රදායේ රඟදක්වන කොතල පදය තුළ වෙනස්කම් දක්නට ලැබේ. උදාහරණ සහිතව පැහැදිලි කරන්න.